# ශ්‍රී ලංකා ස්වේච්ඡා සේවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සෙත්සිරිපාය, බත්තරමුල්ල
ශ්‍රී ලංකාව

# ශ්‍රී ලංකා ස්වේච්ඡා සේවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

"ස්වේච්ඡා සේවය යනු ප්‍රජා ශක්තිය, ප්‍රත්‍යස්ථිතිය, සහයෝගීතාවය සහ සමාජ සහජීවනයේ ප්‍රභවයකි. මේ හරහා විවිධත්වය, සමානාත්මතාවය සහ සියලු දෙනාගේ සහභාගීත්වය පෝෂණය කිරීම තුළ ධනාත්මක සමාජ වෙනසක් ඇති කළ හැකිය. එය සමාජයේ වඩාත්ම වැදගත් වත්කම් අතර පවතී ".
බැන් කී මූන්

"ඔබගේ දායකත්වයේ ගුණාත්මකභාවය අනුව ඔබේ ජීවිතයේ ගුණාත්මකභාවය තීරණය වේ. ඔබ අන් අයගේ ජීවිත වැඩිදියුණු කිරීමට වැඩ කරන විට, ඔබේ ජීවිතය ස්වයංක්‍රීයව දියුණු වේ."
කුරෙක් ඇෂ්ලි

1. පසුබිම

'මහාවංශය' යනු ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 4 වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ පුරාණ ඉතිහාසය විස්තර කරන ඓතිහාසික ග්‍රන්ථයකි. ස්වේච්ඡා සේවයේ නූතන අර්ථ දැක්වීමට සමානත්වයක් දක්වන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර රාශියක් එහි අඩංගු වේ.

පන්සල් කටයුතුවලට සම්බන්ධව තම ශ්‍රමය කැමැත්තෙන් ලබාදෙන පුද්ගලයින්ගේ සංගමය හෙවත් දායක සභාව සහ ගම්වාසීන්ගේ කෘෂිකාර්මික කටයුතු වලට සහාය ලබාදෙන ගොවීන්ගේ සංගමය හෙවත් වැව සභාව පුරාණ ඉතිහාසය තුළ හඳුනා ගනු ලබන ස්වේච්ඡාවෙන් සේවය ලබාදුන් පළමු සංවිධාන වර්ග දෙක වේ. ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය බොහෝවිට සිදුවනුයේ සිය ආගමික ඇදහිලි වලට අනුව සිදු කරන ක්‍රියාකාරකම් මත පදනම්ව බව සංවර්ධනයේ සහභාගීත්ව අන්තර්ක්‍රියා සඳහා ආයතනය (IPID) සිය වාර්තාවල විස්තර කර ඇත: "ශ්‍රී ලංකාව සතුව දීර්ඝ ඉතිහාසයක් සහ ආගම තුලින් හැඩ ගැසුණු ස්වේච්ඡා සේවයක් හා ඒ මත පෝෂණය වූ සංස්කෘතියක් පවතින අතර ඒවා මානව ක්‍රියාකාරකම්වල සියලු අංශ දක්වා ප්‍රායෝගිකව විහිදේ. අතීතයේ සිට මේ දක්වා වූ සියළු වෙනස්කම් හමුවේදීත් ස්වේච්ඡා සේවය සඳහා මිනිසාගේ වූ කැමැත්ත මේ දක්වාම නොවෙනස්ව පවතී. සියළුම ආගම්වල වත්පිළිවෙත් මගින් ස්වේච්ඡා සේවයේ යෙදීම සඳහා වූ ඉඩකඩ පුළුල් කරනු ලැබේ.

ශ්‍රී ලංකාව සතු ප්‍රෞඪ සම්ප්‍රදායේ එක් කොටසක් වන්නේ ස්වේච්ඡා සේවයයි. එය රටේ සංස්කෘතික සාරධර්ම තුළ කිදා බැස පවතී. 20 වන සියවසේ මැද භාගයේ පමණ සිට, ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය ක්‍රමයෙන් වෙනස්කම් වලට භාජනය වීමට පටන් ගත් අතර, එහිදී ප්‍රධාන වශයෙන් 'පුණ්‍ය කටයුතු' වල සිට සංවර්ධනය සඳහා ස්වේච්ඡා සේවය යොදා ගැනීම පිළිබඳ වැඩි අවධානයක් යොමු විය. ස්වේච්ඡා සංගම් වැඩි වශයෙන් සංවර්ධනයට නැඹුරු රාජ්‍ය නොවන සංවිධාන (NGOs) බවට පත්විය. 1980 දශකයෙන් පසුව මෙම ප්‍රවණතාව වේගවත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන කටයුතුවල නියැලී සිටින සංවිධාන සමඟ සම්බන්ධ වන ස්වේච්ඡා සේවකයන්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස ඉහළ ගියේ ය. ඒ අතරම, සහභාගීත්ව ආයතන, ග්‍රාමීය සංවර්ධනය, තිරසාර සංවර්ධනය සහ දරිද්‍රතාවය පිටුදැකීමේ ව්‍යාපෘති වැනි නවතම ආකාරයේ සංවර්ධන වැඩසටහන් ආරම්භ කරන ලදී.

වසර 30 ක් පුරා පැවති සිවිල් ගැටුම ශ්‍රී ලාංකික ජනතාවට මහත් පීඩා ඇති කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජීවිතවලට, පරිසරයට හා දේපළවලට සැලකිය යුතු හානියක් සිදුවිය. තවද, 2004දී ඇති වූ සුනාමියෙන් සැලකිය යුතු ලෙස පීඩාවට පත් වූ රටවල් අතරට ශ්‍රී ලංකාවද එක්විය. ඉතිහාසය තුළ වාර්තා ගත වූ දරුණුතම ස්වාභාවික විපත් වලින් එකක් වන සුනාමිය, ශ්‍රී ලංකාවේ තිස් දහසකට අධික පිරිසකට මරු කැඳවීය.

රටපුරා ඇති වූ එවන් කම්පන සහගත අත්දැකීම් වලින් පසු, විශේෂයෙන් ප්‍රජාවගේ සංවර්ධනය, පශ්චාත් ආපදා ප්‍රතිසංස්කරණ කටයුතු, ආපදා සඳහා පෙර සූදානම් වීමේ සැලසුම් සහ ප්‍රජා මට්ටමින් සිදු කරන ජීවනෝපාය ක්‍රියාකාරකම් වැනි වැඩසටහන් සඳහා ප්‍රාදේශීය ප්‍රජා ස්වේච්ඡා සේවකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් සහභාගී වූහ. කෙසේ වෙතත්, රට තුළ ස්වේච්ඡා සේවය පිළිබඳ ඒකාබද්ධ ප්‍රතිපත්තියක්, ව්‍යුහයන් සහ පද්ධති නොතිබීම හේතුවෙන් සුනාමියෙන් පසු රට තුළ ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී එකම කාර්යය දෙවතාවක් සිදු වීම හෙවත් ප්‍රතිවලිත වීම හා සම්පත් නාස්ති වීම සිදුවිය. පොදුවේ ස්වේච්ඡා අංශය සඳහා හා විශේෂයෙන් ස්වේච්ඡා සේවකයන් සඳහා ව්‍යුහාත්මක ප්‍රවේශයක් නොමැති වීම නිසා ඔවුන්ගේ දායකත්වය සඳහා වටිනාකමක් දිය නොහැකි විය.

රටේ ජාතික උරුමය විසින් හිමිකර දුන් ආචාරධර්ම මත ගොඩනැඟුණු ආගම, සංස්කෘතිය සහ හැසිරීම මගින් සවිමත් වූ මානවවාදී පරමාදර්ශයන් සමඟ ආචාරධර්ම හා සදාචාරාත්මක වටිනාකම් මෙම පද්ධතිය මගින් පවත්වාගෙන යා යුතු ය. එවැනි ආචාරධර්ම පද්ධතියක්, නූතන සමාජයට අදාළ වන මානව කරුණාව, සහයෝගීතාව සහ කරුණාවෙන් පිරිපහදු කොට නඩත්තු කළ යුතු අතර ගුණාත්මක ස්වේච්ඡා සේවය තුළින් එය සාක්ෂාත් වේ.

දැක්ම 2025 සහ දැක්ම 2030 යටතේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන සමාජ, ආර්ථික හා තාක්ෂණික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටී (SDGs).

එබැවින් මෙම ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සංවර්ධනය සඳහා ස්වේච්ඡා සේවකයන්ගේ සම්පත් හා අවස්ථාවන් උපරිම කර ගැනීමටත් රටේ 2025 දැක්ම සහ 2030 දැක්ම යටතේ සැලසුම් සහගත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ රජයේ ප්‍රයත්නයන් සඳහා අතිරේකව දායක වීමටත් හැකි වන රාමුවක් ලබාදෙනු ඇත.

## පූර්විකාව

රටේ සමාජ ආර්ථික සංවර්ධනය, මහජන සුභසාධනය සහ පරිසර ආරක්ෂක ප්‍රයත්නයන් වෙනුවෙන් ජනතාව ස්වේච්ඡාවෙන් සම්බන්ධව කටයුතු කිරීම ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටී.

මාර්ගෝපදේශ මූලධර්ම ඔස්සේ කැපවීම සිදු විය යුතුය :

1. ස්වේච්ඡා සේවකයා සේවයේ යෙදෙන යාන්ත්‍රණ හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
2. ස්වෙච්ඡා ක්‍රියාකාරකම් සිදු කිරීමේදී ස්වෙච්ඡා සේවකයා විසින් අවම පිරිවැයක් පමණක් දරණ බව සහතික කිරීම.
3. ප්‍රජාවන්ගේ සහ රටේ අභිවෘද්ධිය සඳහා අදාළ අංශවල සිදුකරනු ලබන ස්වේච්ඡා කටයුතු උපයෝගී කර ගැනීම.
4. ස්වේච්ඡාවෙන් ලබාදෙනු ලබන සේවාවන් පිළිගැනීම, දිරිගැන්වීම සහ අගය කිරීම.

මෙම මාර්ගෝපදේශ මූලධර්ම මත පදනම්ව රජය ස්වේච්ඡා සේවකයින්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම සඳහා ඇති සියලු හැකියාවන් ගවේෂණය කරනු ඇත. ආර්ථික සහ සමාජ සංවර්ධනය ඉහළ නැංවීම සඳහා ගුණාත්මක සහ ශක්තිමත් ස්වේච්ඡා සේවයක් තුළින් කිසියම් පිටුවහලක් ලැබෙන අතර ස්වේච්ඡා සේවකයන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍යය මේ සඳහා ධනාත්මක බලපෑම් ඇතිකරනු ලබයි. තවද, ස්වේච්ඡා ක්‍රියාකාරකම් තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ හැකියාව රජය විසින් ගවේෂණය කරනු ඇත.

ස්වේච්ඡා සේවය පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තියේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවයට ඇති බාධක ඉවත් කිරීම සහ ස්වේච්ඡා සේවයේ කොන්දේසි වැඩිදියුණු කිරීම පමණක්

නොව, ස්වේච්ඡා සේවකයින්ට ස්වේච්ඡා අවස්ථාවන්වලට ප්‍රවේශ විය හැකි යන්ත්‍රණයන් වැඩි දියුණු කිරීමයි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් පදනම් වනුයේ පැහැදිලි ජාතික අභිමතාර්ථ සහ අරමුණු මත ඉලක්කගත සමායෝජිත ජාතික ප්‍රයත්නයක් මත වේ.

සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු

- ස්වේච්ඡා සේවය පිළිබඳ ජාතික වශයෙන් පිළිගත් මාර්ගෝපදේශ හා භාවිතයන් ශ්‍රී ලංකාව සතුව නොමැත.

- ස්වේච්ඡා සේවය රටේ ඉතිහාසය තුළ පැවති ප්‍රෞඪ සම්ප්‍රදායක් වුවද ස්වේච්ඡා සේවයට පහසුකම් සැපයීම , සම්බන්ධීකරණය හා ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථිර යාන්ත්‍රණයක් හා යටිතල පහසුකම් මේ සඳහා නොමැත. ස්වේච්ඡා සේවය පිළිබඳ වාර්තා කිරීමට පොදුවේ පිළිගත් යාන්ත්‍රණයක් නැති වීම තුළ වර්තමානයේදී මෙම සේවය බෙදී විසිරී ගොස් ඇත .

- ස්වේච්ඡා සේවයේ අවස්ථාවන් පිළිබඳ මහජනතාව නොදැනුවත් වීමත් ඒ සඳහා විශ්වාසදායක ප්‍රවේශයක් නොමැති වීමත් මෙහි ඇති අඩුපාඩු වේ.

- ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන වැයමක වටිනාකම සහ රටේ ආර්ථිකයට එහි ඇති දායකත්වය සොයා ගැනීමට යාන්ත්‍රණයක් ශ්‍රී ලංකාව තුළ තවම ස්ථාපිත කර නොමැත.

- ස්වේච්ඡා කටයුතු සඳහා තම කාලය හා ශ්‍රමය වෙන් කිරීමට කැමැත්තක් සහ හැකියාවක් දක්වන පිරිසක් අප සමාජයේම සිටින අතර ඔවුන් ඒ සඳහා ඉහළ උනන්දුවක් හා කැපකිරීමක්ද පෙන්නුම් කරයි.

- උගත් හා පළපුරුදු විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විශාල සංඛ්‍යාවක් ස්වේච්ඡාවෙන් සේවය ලබා දීම සඳහා සවිබලගැන්විය හැකි අතර ඒ සඳහා ඔවුන්ගේ නිදහස් කාලය ලබා ගැනීමේ යාන්ත්‍රණයක් සකස් කර නොමැත.
- අ.පො. ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) විභාග නිම කර ඇති සිසුන්ට තම ඉදිරි උසස් අධ්‍යාපන කටයුතු සැලසුම් කර ගන්නා තෙක් සිටීමට සිදුවනුයේ සංක්‍රාන්ති සමයකය. මේ කාලය තුළ ඔවුනගේ නව යොවුන් ශ්‍රමය සහ කාලය ඵලදායි ලෙස ස්වේච්ඡා සේවයේ යොදවා ගත හැකි නමුත් මෙවැනි යාන්ත්‍රණයක් නොමැති වීම තුළ මෙවැනි කාර්යයක සංවිධානය වීමක් හෝ සම්බන්ධිකරණය වීමක් සිදු නොවේ.

- විශ්ව විද්‍යාල සිසුන්ට විශ්ව විද්‍යාලයේ වර්ෂාර්ධ (semester) අතර කාලය ස්වේච්ඡා සේවය සඳහා යෙදවිය හැකි නමුදු ඔවුනගේ එම වැයම අධ්‍යයන අවශ්‍යතාවයක් ලෙස හෝ සමාජයට / සමාජ වැඩ පළපුරුද්දට දායකත්වයක් ලෙස හෝ ඉහත දෙයාකාරයටම අවශ්‍ය වන කරුණක් ලෙස හෝ හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් නොමැත.

- ස්වේච්ඡා සේවය පිළිබඳ රට තුළ අවබෝධයක් නොමැති අතර සාමාන්‍යයෙන් පොදු ජනයාට සහ සමාජයට එහි වැදගත්කම පිළිබඳ වැටහීමක් නොමැත. ස්වේච්ඡා සේවය ද රට තුළ අර්ථ දැක්වෙනුයේ වෙනස් අයුරකින්ය.

- ස්වේච්ඡා සේවය හා සම්බන්ධ විෂයයන් /අදාළ කටයුතු / කරුණු පිළිබඳ පර්යේෂණ කිරීමට දිරිගැන්වීමක් නොමැත.

- පාසැල් / උසස් අධ්‍යාපන විෂය මාලාවේ ස්වේච්ඡා සේවය විෂයයක් ලෙස හඳුන්වාදීමට කිසිදු සැලකිය යුතු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නමුත් අන්තර් සමාජ, බාලදක්ෂ හා බාලදක්ෂිකා සංගම් , රතු කුරුස වැනි සංවිධාන වලට සම්බන්ධ ශිෂ්‍යයන් ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල නිරත වේ.

- ස්වේච්ඡා සේවයේ ප්‍රශංසනීය මෙහෙවර කිහිපයක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින නමුදු පුද්ගලයන් සහ සංවිධානවල කැපී පෙනෙන ස්වේච්ඡා දායකත්වයන් හඳුනා ගැනීම සඳහා ජාතික වශයෙන් පිළිගත් යාන්ත්‍රණයක් තවමත් ප්‍රධාන ධාරාවේ නොමැත.

- ස්වේච්ඡා කටයුතු සම්බන්ධයෙන් සංස්ථාගත අංශයේ මැදිහත් වීම හා සහය ලබා ගැනීමට විධිමත් යාන්ත්‍රණයක් නොමැත.

## 2. අරමුණ

මෙම ප්‍රතිපත්තියේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා දේශපාලන සංවර්ධනය සඳහා ස්වේච්ඡා දායකත්වය උපරිම කිරීමට ශක්තිමත් ස්වේච්ඡා අංශයක් ගොඩනැංවීම, දිරිමත් කිරීම සහ ඒ සඳහා මඟ පෙන්වීම වේ.

## 3. ප්‍රතිපත්තිය මඟින් අපේක්ෂිත අරමුණු වල සඵලතාවය (තාර්කිකත්වය)

ශ්‍රී ලංකාව මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින සංවර්ධන ක්‍රියාවලියේදී විවිධ සංකීර්ණ අභියෝග වලට මුහුණ දෙමින් සිටී . දිළිඳුකම පිටු දැකීම, දරුවන්ට අදාළ ගැටළු, කුසලතා සංවර්ධනය, සමාජය යළි ඒකාබද්ධ කිරීම හා සංහිඳියාව, අභියෝග රැසකට මුහුණ දෙන තරුණ ප්‍රජාව, කාන්තා නායකත්වයෙන් යුතු පවුල්, කාන්තාවන් සවිබලගැන්වීම, ඒඩ්ස්, ඩෙංගු සහ ඒ හා සමාන රෝග මැඩපැවැත්වීම, දැනුම ආර්ථික දියුණුවට උපයෝගී කර ගැනීම, මිනිස් ජාවාරම, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, ආහාර හා කෘෂිකර්මය සංවර්ධනය, තාක්ෂණයේ උපයෝගී දායකත්වය වැඩි කිරීම, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් නැංවීම, ජල සම්පත් කළමනාකරණය, පරිසර කළමනාකරණය හා සංවර්ධනය, නිවාස සංවර්ධනය යන අංග වල ප්‍රමුඛතාවයක් උසුලයි. මෙම සන්දර්භය තුළ ස්වේච්ඡා සේවාවේ දායකත්වය සුවිශේෂී වේ. එකී අභියෝග ජය ගැනීම සඳහා රට තුළ ස්වේච්ඡා සේවයට කැපවූ පිරිසගෙන් මහඟු දායකත්වයක් ලබා ගත හැකිය. එම ප්‍රයෝජනයට නොගත් ශ්‍රම සම්පත ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

## 4. අර්ථ දැක්වීම

"ස්වේච්ඡා සේවකයා" යන්නෙහි තේරුම –

අ. ස්වේච්ඡාවෙන් වැඩ කිරීමට කැමැත්තක් දක්වන සහ මෙම ප්‍රතිපත්තියේ සඳහන් ස්වේච්ඡා සේවය පිළිබඳ අර්ථ දැක්වීම අනුගතව ක්‍රියා කරනු ලබන ඕනෑම ශ්‍රී ලාංකිකයෙකු ;

ආ. මෙරට රැදී සිටීමට අදාළ රාජ්‍ය බලධාරීන්ගේ අනුමැතියට යටත්ව ස්වේච්ඡාවෙන් වැඩ කිරීමට කැමැත්තක් දක්වන සහ මෙම ප්‍රතිපත්තියේ සඳහන් ස්වේච්ඡා සේවය පිළිබඳ අර්ථ දැක්වීමට අනුගතව ක්‍රියා කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම විදේශීය ස්වේච්ඡා සේවකයෙකු ;

"ස්වේච්ඡා සේවා" ස්වේච්ඡා සේවය යනු මානව සුභ සිද්ධිය උදෙසා, කිසිදු පෞද්ගලික ප්‍රතිලාභයක අපේක්ෂාවෙන් තොරව අවසන් ප්‍රතිලාභියාට අමතර පිරිවැයක් සිදු නොවන ආකාරයට ස්ව කැමැත්තෙන් සිදුකෙරෙන උතුම් සත්ක්‍රියාවකි

ස්වේච්ඡා සේවකයන් තම මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා "ස්වේච්ඡා සේවයේ නියුතු සංවිධාන / අංශ" පිහිටුවා ගනු ලබන අතර ඒවා සමාජ සේවය සඳහා වන අතර එහිදී මෙම සංවිධාන වල අයිතිකරුවන්ට හෝ අධ්‍යක්ෂවරුන්ට මූල්‍ය ප්‍රතිලාභ අත්කර නොදේ.

යම් යම් අවස්ථාවන්වලදී පහත සඳහන් ආයතනද ස්වේච්ඡා සේවයේ යෙදේ –

(i) රාජ්‍ය ආයතන ;
(ii) සංස්ථාගත අංශයේ සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් ; ( refers mainly to private sector)
(iii) අදාළ ලියාපදිංචිය සහිත ලාභ නොලබන ව්‍යාපාර ;
(iv) අදාළ ලියාපදිංචිය සහිත සංවිධාන, සමිති, ප්‍රජා මූල සංවිධාන, සමාජ ව්‍යවසාය, රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන.
(v) තරුණ ප්‍රජාව ප්‍රමුඛ සංවිධාන

**5.** ප්‍රතිපත්තියේ දැක්ම

"පොදු ජනතාවගේ සංතෘෂ්ටිය පෝෂණය කරන පරිදි ස්වේච්ඡතාවේ ගිනි පුලිඟු හැම හදවතකම දැල්වීම".

**6.** ප්‍රතිපත්තියේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය ශක්තිමත් කිරීම සහ වැඩි දියුණු කිරීම උදෙසා සහ ප්‍රජාවන්හි හා ජාතියේ වේගවත්, සියල්ල අන්තර්ගතවූ සහ කැපී පෙනෙන සුවිසල් සංවර්ධනයක් උදෙසා ස්වේච්ඡා සේවය උත්ප්‍රේරකයක් ලෙස භාවිතා කිරීමට;

**7.** ප්‍රතිපත්තියේ මූලික අරමුණ

ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය විධිමත් කිරීම , ස්වේච්ඡා සේවය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම සහ ප්‍රජා යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ස්වේච්ඡා සේවය අත්‍යාවශ්‍ය මෙවලමක් බවට පත් කිරීම.

**8.** විශේෂිත අරමුණු

1. රට තුළ ස්වේච්ඡා සේවය ප්‍රවර්ධනය කිරීම.
2. රටේ සෑම අංශයකම ස්වේච්ඡා සේවය ස්ථාපිත කිරීම සහ එහි සේවාව ඇගයීම.
3. ස්වේච්ඡා සේවය කළමනාකරණය සහ සම්බන්ධීකරණය කිරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම.
4. ස්වේච්ඡා සේවය පිළිබඳ පර්යේෂණ දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
5. භාණ්ඩාගාරයට අමතර වියදමක් ඇති නොවන පරිදි ස්වේච්ඡා සේවය හරහා රාජ්‍ය සේවාවන් පුළුල් කිරීම .
6. ප්‍රයෝජනයට යොදා ගනු නොලබන මිනිස් පැය ඵලදායි අරමුණු සඳහා ස්වේච්ඡා සේවය යොදා ගැනීමේ හැකියාවන් සොයා බැලීම .
7. සුදුසු නීති සම්පාදනය තුළින් රටේ ස්වේච්ඡා සේවය විධිමත් කිරීම සඳහා සහාය වීම.

8. ස්වේච්ඡා සේවය සඳහා ප්‍රතිපත්ති රාමුවක් සැකසීම.
9. ස්වේච්ඡා සේවකයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීම.
10. ස්වේච්ඡා සේවකයින් විසින් කරනු ලබන සේවාවන් සඳහා නිසි පිළිගැනීමක් ලබා දීම සඳහා ස්වේච්ඡා සේවකයන් ඇගයීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

## 9. ස්වේච්ඡා සේවයේ යෙදෙන ආකාර

පහත දැක්වෙන ආකාරයේ ස්වේච්ඡා ක්‍රම මෙම ප්‍රතිපත්තිය මඟින් හඳුනා ගත හැක:

අ. <u>ආපදා සඳහා පෙර සූදානම් වීම, කළමනාකරණය සහ ප්‍රතිචාර දැක්වීම</u> : මෙය ආපදා අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීම සඳහා ස්වේච්ඡා සේවා සැපයීම හා හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම හා සම්බන්ධ වේ.

ආ සියලු ජන වාර්ගික කොටස් වල එකතුව : මේවා සාමූහික ප්‍රයත්නයන් වන අතර පුද්ගලයන්ගේ අදහස්, අවශ්‍යතා, රුචිකත්වයන් හෝ අභියෝග එක් අරමුණක් වෙනුවෙන් ක්‍රියාකිරීමේදී අදාළ කාර්යය සඳහා කිසියම් බලයක් ඇති කරයි.

ඇ <u>පරිත්‍යාගශීලිත්වය</u>: පරිත්‍යාගශීලිත්වය යනු මූල්‍යමය, වෘත්තීය හෝ කාරුණික ආකාරයෙන් අන්‍යයන්ට තනි හෝ සාමූහික සේවාවක් සැපයීමයි.

ඈ <u>පක්ෂපාතීබව සහ පුරවැසි මැදිහත්වීම</u>: මෙය වඩා හොඳ පාලනයක් සම්බන්ධයෙන් දැනුවත්කිරීම් සහ ඒත්තු ගැන්වීම සඳහා තනි පුද්ගලයින් හෝ කණ්ඩායම් විසින් සේවාවන් සැපයීම වේ.

ඉ මෙම ප්‍රතිපත්තියේ තාර්කිකත්වය තුළ හඳුනාගෙන ඇති ගැටළු වලට විසඳුම් ලබා දෙන වෙනත් අදාළ ක්‍රම පවතී.

## 10. ස්වේච්ඡා සේවය වර්ග කිරීම.

ප්‍රතිපත්තිය හරහා පහත දැක්වෙන ආකාරයේ ස්වේච්ඡා සේවකයන් හඳුනා ගත හැක. :

i. තරුණ ස්වේච්ඡා සේවකයන් – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි වයස අවුරුදු 15-29 අතර තරුණ තරුණියන්

ii. විශ්‍රාමික ස්වේච්ඡා සේවකයන් - විධිමත් රැකියාවෙන් විශ්‍රාම ගත් පුද්ගලයින් ස්වේච්ඡාවෙන් සිය සේවාවන් ලබා දීම

iii. අන්තර්ජාලීය (online) ස්වේච්ඡා සේවකයන් - නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් ස්වේච්ඡා සේවා සපයන තනි පුද්ගලයින් හෝ කණ්ඩායම්.

iv. ආයතන පදනම් වූ ස්වේච්ඡා සේවකයන් - සංවිධාන හෝ ආයතන හරහා ස්වේච්ඡා සේවා සපයන තනි පුද්ගලයින් හෝ කණ්ඩායම්

v. ජාත්‍යන්තර ස්වේච්ඡා සේවකයන් – ශ්‍රී ලංකාව තුළ ස්වේච්ඡා සේවා සපයන ශ්‍රී ලාංකික නොවන අය සහ විදේශයන්හි ස්වේච්ඡා සේවා සපයනු ලබන ශ්‍රී ලාංකිකයන් .

vi. ඩයස්පෝරා ස්වේච්ඡා සේවකයන් - ස්වේච්ඡා සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශගතව වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්.

vii. ප්‍රජා මූල ස්වේච්ඡා සේවකයන් - ස්වකීය ප්‍රජාවන් තුළ අවිධිමත් (informal) ලෙස ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල යෙදෙන තනි පුද්ගලයින් හෝ කණ්ඩායම්.

viii. ළමුන් සහ නව යොවුන් ස්වේච්ඡා සේවකයන් - වැඩිහිටියෙකුගේ හෝ ආයතනයක මඟ පෙන්වීම යටතේ වයස අවුරුදු 18 ට අඩු ශ්‍රී ලාංකිකයන් ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල යෙදීම

ix. රජයේ ස්වේච්ඡා වැඩසටහන්

x. වෘත්තීය ස්වේච්ඡා සේවකයන් - විවිධ අංශවල ක්‍රියාකාරී වියිමත් රැකියාවක නියුතු වෙමින් අර්ධ කාලීනව ස්වේච්ඡාවෙන් සිය සේවාවන් ලබා දෙන පුද්ගලයින්.

**11.** ස්වේච්ඡා දායකත්වයන් සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශ

- සෞඛ්‍ය
- තරුණ කටයුතු
- ක්‍රීඩා
- අධ්‍යාපන
- අපාදා වැළැක්වීම් සහ කළමනාකරණය කිරීම
- සමාජ ඒකාබද්ධතාවය, සමාජ සේවය සහ සමාජ සුභසාධනය
- කෘෂිකර්මය
- වන විද්‍යාව
- ජලය
- දේශගුණික විපර්යාස
- ආගමික හෝ ඇදහිලි පදනම් කරගත් ස්වේච්ඡා සේවය
- තාක්ෂණ සංවර්ධනය
- ස්වේච්ඡා සේවය මගින් මානව යහපැවැත්මට සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකි වෙනත් අංශ

**12.** ප්‍රතිපත්ති ඉලක්කය

අ. රටේ සියලුම අංශ තුළ ස්වේච්ඡා සේවය සඳහා සමාජ සංවාද හා හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම **.**

1. සියළුම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ සංස්ථා ආශ්‍රිතව ස්වේච්ඡා සේවය හඳුනා ගැනීම සහ ස්වේච්ඡා සේවකයින් සම්බන්ධ කර ගනිමින් රාජ්‍ය සේවය පුළුල් කිරීම සඳහා යාන්ත්‍රණ සැකසීම
2. රාජ්‍ය අංශයේ සේවක ස්වේච්ඡා සේවය;
3. සංස්ථාගත අංශය සඳහා ආයතනික පදනම් ස්වේච්ඡා සේවයක් අනුගත කිරීම -
   (i) එම කායීය මණ්ඩල සාමාජිකයින් විශේෂ අනුගත දිනයන්හිදී ස්වේච්ඡා සේවය සඳහා බඳවා ගැනීම
   (ii) බාහිර වියිමත් ස්වේච්ඡා ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වය;
   (iii) ඉහළ ජාතික ප්‍රතිලාභයක් සඳහා ස්වේච්ඡා සේවකයින් සම්බන්ධ කර ගනිමින් සහ ඔවුන්ගේ සංස්ථාගත සමාජ වගකීම් (CSR) පුළුල් කිරීම සඳහා වඩාත් අර්ථවත් යාන්ත්‍රණ අනුගමනය කිරීම;
   (iv) ස්වේච්ඡා සේවයේ යෙදී සිටින සේවකයින් සඳහා සුදුසු ආරක්ෂාව සහ ආපදාවකදී වන්දි ලබා දීමේ යාන්ත්‍රණ අනුගමනය කිරීම;
   (v) ස්වේච්ඡා දායකත්වය සලකා දිරිගැන්වීම් ලබා දෙමින් සංස්ථාගත අංශයේ ස්වේච්ඡා ක්‍රියාකාරකම් දිරිමත් කිරීම;
   (vi) මානව යහපැවැත්ම හා සම්බන්ධ ස්වේච්ඡා ක්‍රියාකාරකම් සඳහා පෞද්ගලික අංශයේ සංස්ථාගත සමාජ වගකීම් අරමුදල් (CSR) වෙන් කිරීමට දිරිගැන්වීම.

ආ. ආරක්ෂිත හා හිතකර ස්වේච්ඡා සේවා පරිසරයක් සැපයීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම;

ඇ. ස්වේච්ඡා කළමනාකරණ සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ඇති කිරීම

ශක්තිමත්, විවෘත, තිරසර සහ ජාතික ස්වේච්ඡා සේවයක යටිතල ව්‍යුහයේ පදනම වෙමින් ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය කිරීමේ ආයතනයක් ලෙස ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය (National Volunteering Secretariat) විෂයභාර අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇත. ඊට අමතරව, ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය හරහා ප්‍රතිපත්තියේ සඳහන් කොට ඇති ආයතන සමඟ ඒකාබද්ධව සුදුසු ව්‍යාපෘති / වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත. ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයක් පිහිටවනු ලැබේ.

ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ මූලික ක්‍රියාකාරකම් –

(i) යාවත්කාලීන ස්වේච්ඡා කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම (Volunteer Management System);

(ii) විවිධ විශේෂ දක්ෂතා සහිත ස්වේච්ඡා සේවකයන්ගේ තොරතුරු පවත්වාගෙන යාම, නමුත් ඒ හේතුව මත ස්වේච්ඡා සේවකයන්ට සහ ස්වේච්ඡා සේවකයන් සම්බන්ධ ආයතන වලට කිසිදු නීතිමය අයිතිවාසිකමක් ලබා නොදෙන ලෙස කටයුතු කිරීම.

(iii) සතියකට පැය 20-30 වැඩ වැඩි කාල සීමාවක් ඇතුලත් වන විදිමත් ස්වේච්ඡා සේවයන් සඳහා ස්වේච්ඡා කොන්ත්‍රාත්තුවක් නිකුත් කිරීම

(iv) ස්වේච්ඡා සේවකයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ හා රෙගුලාසි නිකුත් කිරීම

(v) සුදුසු නීතිමය තත්ත්ව යටතේ දැනට ලියාපදිංචි වී ඇති ස්වේච්ඡා සේවකයින් යොදවාගන්නා සංවිධාන (Volunteer Involving Organisations) වල තොරතුරු පවත්වා ගැනීම;

(vi) ස්වේච්ඡා සේවා කළමනාකරණ පද්ධතියේ (Volunteer Management System) දක්වා ඇති පරිදි හෝ මගින් ලිකිතව දැනුම් දී ඇති ස්වේච්ඡ සේවක අවස්ථා සඳහා පහසුකම් සැලසීම ස්වේච්ඡා සේවකයන් අවසන් කළ කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රගතිය ලබා ගැනීම ;

(vii) අවසන් කරන ලද ස්වේච්ඡා පැවරුම් පිළිබඳ ප්‍රතිචාර ලබා ගැනීම

(viii) අවසන් කරන ලද කාර්යයයේ (පැවරුමේ) තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම;

(ix) ස්වේච්ඡා සේවා කාර්යයන් සඳහා අවම දායකත්ව අගයන් දැක්වෙන පරිදි සුදුසු වාර්තා සකස් කිරීම;

(x) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ වෙනත් අදාළ ආයතන සමඟ ඉහත සංඛ්‍යාලේඛන හුවමාරු කර ගැනීම ;

(xi) අවශ්‍ය අවස්ථාවල ස්වේච්ඡා සේවයේ යෙදවීමට අදාළව බලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම;

(xii) පාර්ශවකරුවන් සමඟ ද්වි වාර්ෂික රැස්වීම් සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම

(xiii) ස්වේච්ඡා සේවකයන් සඳහා සුදුසු පරිදි සම්බන්ධීකරණය හා පෙළ ගැස්වීම සිදු කිරීම

(xiv) සිසුන්ට වැදගත් සමාජ අත්දැකීමක් ලබා ගැනීමට හැකිවන ලෙස ස්වේච්ඡා සේවය ප්‍රවර්ධනය කිරීම;

(xv) ස්වේච්ඡා සේවයට අදාළ විෂයයන් සහ ගැටළු පිළිබඳ පර්යේෂණ පැවැත්වීමට අදාළ දිරිමත් කිරීම් සිදු කිරීම ;

(xvi) ස්වේච්ඡා සේවය රටතුළ විධිමත් කිරීම සඳහා සහාය ලබාදෙන අංශ සමඟ නිරන්තර සංවාදයක් පවත්වා ගෙන යෑම ;

(xvii) ස්වේච්ඡා සේවකයින්ගේ සහභාගීත්වය සහිතව, පවත්නා රාජ්‍ය සේවාවන් පුළුල් කිරීම සඳහා රාජ්‍ය අංශය දිරිමත් කිරීම.

ඇ . ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ (National Volunteering Secretariat) කළමනාකරණ මණ්ඩලය පහත දක්වා ඇති වෘත්තිකයන් සහ පුද්ගලයන්ගෙන් සමන්විය යුතු අතර එහි කාර්යභාරයන් සහ වගකීම් සාමූහිකව තීරණය කරනු ලැබේ.

(i) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය ;

(ii) අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද විෂය භාර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හෝ අධ්‍යක්ෂක තනතුර දරන ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු

(iii) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආරාධනය කරනු ලබන තරුණ කටයුතු, අධ්‍යාපනය, මුදල් , සෞඛ්‍ය සහ පරිසර යන අමාත්‍යාංශ වල අතිරේක ලේකම් හෝ අධ්‍යක්ෂක යන තනතුරක සිටින නිලධාරීන් එකී අමාත්‍යාංශ වල නියෝජිතයන් සාමාජිකයින් ලෙස;

(iv) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආරාධනය කරනු ලබන වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපති හෝ උප සභාපති හෝ ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරක සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සාමාජිකයෙකු ලෙස ;

(v) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආරාධනා කරනු ලබන සිවිල් සමාජයේ සාමාජිකයින් දෙදෙනෙකු සාමාජිකයින් ලෙස;

(vi) ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සංවිධානයේ කටයුතු කරනු ලබන එක් සාමාජිකයෙකු ;

(vii) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආරාධනය කරනු ලබන සංස්ථාපිත සමාජ වගකීම් (CSR) පිළිබඳ ප්‍රධානී, කළමනාකරණ අධ්‍යක්ෂක, ප්‍රධාන විධායක නිලධාරී හෝ අරමුදල් ප්‍රධානී යන තනතුරක සිටින එක් ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ;

(viii) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආරාධනය කරනු ලබන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු;

(ix) තරුණ ප්‍රජාව ප්‍රමුඛ කොට ගත් සංවිධානයක ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ;

(x) රාජ්‍ය නොවන සංවිධානයක නියෝජිතයෙකු (NGO);

(xi) ස්වේච්ඡා සේවකයින් යොදවාගන්නා සංවිධාන නියෝජනය කරමින් නියෝජිතයන් දෙදෙනෙකු;

(xii) පර්යේෂණ ආයතනයන් හෝ පර්යේෂණ ආයතනයකින් පර්යේෂකයන් දෙදෙනෙකු හෝ නියෝජිතයන් දෙදෙනෙකු ;

(xiii) පෙර පැවති V සම්මාන උළෙල වල සම්මානලාභීන් දෙදෙනෙකු හෝ අවසන් තරඟකරුවන් දෙදෙනෙකු ;

(xiv) කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, සභාපතිවරයා විසින් යෝජනා කරනු ලබන, මණ්ඩලයේ සාමාජිකයෙකු වැඩ බලන සභාපතිවරයා ලෙස පත්විය යුතු වේ.

ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ කළමනාකරණ මණ්ඩලය තුළ ආබාධිත පුද්ගලයින්ට සමාන අවස්ථා ලබා දීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ජනවාර්ගික සමතුලිතතාවය පවත්වා ගැනීම වැදගත් ය.

ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ (National Volunteering Secretariat) ප්‍රධානියා කළමනාකරණ මණ්ඩලයේ කැඳවුම්කරු / ලේකම් විය යුතුය

**13.** ස්වේච්ඡා සේවක කොන්ත්‍රාත්තුවක් නිකුත් කිරීම

විධිමත් ලෙස ස්වේච්ඡා සේවයේ යෙදීසිටි නම් ස්වේච්ඡා සේවක කොන්ත්‍රාත්තුවක් නිකුත් කරනු ලැබේ. එවැනි ස්වේච්ඡා සේවයක්,

- සතියකට පැය 20 – 30 ක කාලසීමාවක් ඉක්මවා ලිය යුතුය.
- ස්වේච්ඡා සේවකයින් යොදවාගන්නා සංවිධාන (Volunteer Involving Organisations) ලෙස ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වූ අමාත්‍යාංශයක්, රාජ්‍ය ආයතනයක්, පෞද්ගලික අංශයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හරහා ක්‍රියාත්මක විය යුතුය.

එලෙස කොන්ත්‍රාත්තුගත ස්වේච්ඡා කාල පරිච්ඡේදයක් තුළ සිය මූලික ජීවන වියදම් පියවා ගැනීම සඳහා දීමනාවක් ලබා ගැනීමට ස්වේච්ඡා සේවකයාට හිමිකමක් ඇත.

**14.** ස්වේච්ඡා සේවකයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්

ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවකයන්ට පහත සඳහන් අයිතිවාසිකම් හිමිවේ:

(i) ස්වේච්ඡා ක්‍රියාකාරකම් වල නිරත වීමේදී සුරක්ෂිතභාවය.

(ii) ස්වේච්ඡා ක්‍රියාකාරකම් වලට අදාළව වැය වියදම් ප්‍රතිපූරණය.

(iii) සතියකට පැය 20-30 වැඩි කාල සීමාවක් ඇතුලත් වන විදිමත් ස්වේච්ඡා සේවයන් සඳහා නිකුත් කරන ලද ස්වේච්ඡා කොන්ත්‍රාත්තුවක්.

(iv) ස්වේච්ඡා සේවය පිළිබඳ ලිඛිත තහවුරු කිරීමක්.
(v) ඉටුකරන ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු පුහුණුව.
(vi) ස්වේච්ඡා සේවය අතරතුර වෘත්තීය සහාය.
(vii) පෞද්ගලිකත්වය සහ පෞද්ගලික දත්ත වල ආරක්ෂිතභාවය.

පහත සඳහන් දෑ සම්බන්ධයෙන් ස්වේච්ඡා සේවකයන් වගකීම දරනු ඇත :

(i) ස්වේච්ඡා ක්‍රියාකාරකම් කඩිනමින් හා විශ්වාසදායක ලෙස සිදු කිරීම.
(ii) ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයෙන් දන්වා සිටින විට ස්වේච්ඡා පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩමුළු, රැස්වීම්, දිශානති වැඩසටහන් සඳහා සහභාගී වීම .
(iii) සමාජයේ සංස්කෘතික, සාම්ප්‍රදායික හා වාර්ගික භූමිකාවන් පිළිබඳ දැඩි අවබෝධයක් ඇතිව ස්වේච්ඡා සේවා ක්‍රියාත්මක කිරීම සහ විවිධ ප්‍රජා කොටස් සමඟ සුමට වැඩ කිරීමේ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.
(iv) සිදු කරනු ලබන ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල / සේවාවල ගුණාත්මකභාවය සහතික කිරීම
(v) ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය (National Volunteering Secretariat) විසින් නිකුත් කරන ලද ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම.
(vi) ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ (National Volunteering Secretariat) සහ අනෙකුත් අදාළ ආයතනවල ආචාර ධර්ම පද්ධති වලට අනුගත වීම .

**15. නීති සම්පාදනය**

ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය විධිමත් කිරීම සඳහා රජය විසින් ස්වේච්ඡා සේවය සම්බන්ධයෙන් නීති සම්පාදන කොට බලාත්මක කල යුතුය.

**16. ක්‍රියාත්මක කිරීම**

ස්වේච්ඡා සේවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගෙන් විමසා විෂයභාර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ඇත.

**17. ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම**

ස්වේච්ඡා සේවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සෑම වසර තුනකට වරක් හෝ කළමනාකරණ මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි සමාලෝචනය කළ යුතුය.

**18. අධීක්ෂණය සහ ඇගයීම**

ස්වේච්ඡා කටයුතු පිළිබඳ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා ඇගයීම ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය (National Volunteering Secretariat) මගින් සිදු කළ යුතුය.